

## රජය සතු විශාලතම අලෙවිසැල් ජාලය සඳහා
# කළමනාකරු - මානවසම්පත් හා පරිපාලන (MM 1-1)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ මානව සම්පත් කළමනාකරණය /රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමණාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධියක්,

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.

(02) පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අන්තර් මධ්‍යම මට්ටමේ (Intermediate Level) වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

(01) ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(02) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකරණ (JM) මට්ටමේ තනතුරක වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

**වැටුප් හා අනෙකුත් දීමනා : MM 1-1 Rs. [53,175 – 10 x 1375 – 15 x 1,910 – 95,575]**
මූලික වැටුප : රු. 53,175/- (මීට අමතරව තනතුරට අදාලව රජය විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.)
(ප්‍රවාහන දීමනාව රු.12,500/- + ජංගම දුරකථන ප්‍රතිපූර්ණය රු.3,000/- (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

**පත්වීමේ ස්වභාවය:** ස්ථිර

**සුදුසු අයදුම්කරු සතුව,**

- දත්ත අගැයුම්කිරීමේ, සමාලෝචනය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ හැකියාව සමග විශිෂ්ඨ විශ්ලේෂණාත්මක ගැටළු විසඳීමේ සහ සංවිධානමය කුසලතා තිබිය යුතුය.ඉහළ ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයෙකු විය යුතුය.
- ඉහළ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ප්‍රශස්ත මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියාවෙන් යුක්ත විය යුතුය.
- බහුවිධ කණ්ඩායම් මෙහෙයවීමට සහ අධීක්ෂණය කිරීමට හැකි බවට සනාථ කළ හැකි සාධක තිබිය යුතුය. මානව සහ වෙනත් සම්පත් කාර්යක්ෂමව කළමණාකරණයට හා නිසි ලෙස යෙදවීමට පළපුරුද්ද තිබිය යුතුය.
- පුහුණු සහ සංවර්ධන ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

**සෑම අයදුම්කරුවෙකුම,**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
II. තනතුරේ කාර්යභාරය හොඳින් ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.
III. විශිෂ්ඨ පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමග මෙම දැන්වීම පලවී දින 14 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි **"subject"** තීරුවෙහි සඳහන් කල යුතුය).

(කෙටි ලැයිස්තුගත කළ අපේක්ෂකයන්ට පමණක් ආයතනය විසින් ප්‍රතිචාර දක්වනු ලැබේ.)

වෙළඳ අමාත්‍යාංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහළ,වොක්ෂෝල් වීදිය, කොළඹ 02

LANKA SATHOSA